# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 84 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 18/01/2024 පැය 0725

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාමක් - පොතුහැර පොලිස් වසම.**

2024.01.17 වන දින රාත්‍රී කාලයේ පොතුහැර පොලිස් වසමේ ගල්ටොම්බුව ප්‍රදේශයේදී පුද්ගලයෙකු අනවසර විදුලි රැහැනක ගැටීම හේතුවෙන්, විදුලි සැර වැදී මියගොස් ඇති බවට පොතුහැර පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මියගිය පුද්ගලයා වයස අවුරුදු 47 ක් වන මාවතගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර ඥාතීන් වෙත භාර දී ඇති අතර, මෙම අනවසර විදුලි රැහැන අදින ලද වයස අවුරුදු 47 ක් වන ඉහත ප්‍රදේශයේ පදිංචි සැකකරු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. මෙම සැකකරු විසින් සතුන් දඩයම් කිරීම සඳහා මෙම විදුලි රැහැන ඇද ඇති බවට සිදුකල විමර්ශනවල දී අණාවරනය වි ඇත. පොතුහැර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – කිරිබත්ගොඩ පොලිස් ස්ථානය.**

2024.01.18 වන අද දින අළුයම් කාලයේ කිරිබත්ගොඩ පොලිස් වසමේ YMBA බස්නැවතුම් පොල අසල දී කිරිබත්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 65 මිලිග්‍රෑම් 200 ක් හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැක කරන මුදල් රුපියල් 39,500/- ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කිරිබත්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නිකවැරටිය පොලිස් ස්ථානය.**

2024.01.17 වන දින උදෑසන කාලයේ දී නිකවැරටිය පොලිස් වසමේ හාතිගම්මන ප්‍රදේශයේදී නිකවැරටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන හාතිගම්මන, නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

නිකවැරටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - කිරිබත්ගොඩ පොලිස් වසම.

2024.01.17 වන දින උදෑසන කාලයේ කිරිබත්ගොඩ පොලිස් වසමේ කිරිබත්ගොඩ මාකොළ මාර්ගයේ මාකොළ පල්ලිය ඉදිරිපිට දී කිරිබත්ගොඩ දෙස සිට මාකොළ දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාර්ගයේ වම්පස නවතා තිබූ කාර් රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියදුරු කිරිබත්ගොඩ රෝහලට ඇතුලත් කිරීමේ දී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වන එඬේරමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කිරිබත්ගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිරිබත්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - මදුරන්කුලිය පොලිස් වසම.

2024.01.17 වන දින රාත්‍රී කාලයේ මදුරන්කුලිය පොලිස් වසමේ මැල්ලම්පිටිය පුලදිවයල් මාර්ගයේ විරුතෝඩය ප්‍රදේශයේ දී මැල්ලම්පිටිය දෙස සිට පුලදිවයල් දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගයේ දකුණුපසට හැරවීමේදී එම මාර්ගයේම පුලදිවයල් දෙස සිට මැල්ලම්පිටිය දෙසට විදුලි පහන් නොමැතිව හා ලියාපදිංචි අංකයක් නොමැතිව ධාවනය වූ යතුරුපැදියක් ලොරි රථයේ බඳෙහි ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 15 ක් වන විරුතෝඩය, මදුරන්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, අනතුරට සම්බන්ධ ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මදුරන්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.